# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන අංශයේ ප්‍රකාශනයකි*

**තාක්ෂණික පත්‍රිකා අංක 04 - 2013 මාර්තු**


## 2013 යල කන්නයේ වර්ෂාපතන පුරෝකථනය

2013 යල කන්නයේ මැයි, ජූනි, ජූලි, අගෝස්තු මාස වලදී දිවයිනේ ඒ ඒ ප්‍රදේශ වල අපේක්ෂිත වර්ෂාපතනයන් ලැබීමට බොහෝ සෙයින් ඉඩ ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කරනු ලබන බව ස්වභාවික සම්පත් කළමණාකරන මධ්‍යස්ථානයේ දේශගුණික අංශ ප්‍රධානී ආචාර්ය බී. වී. ආර්. පුණ්‍යවර්ධන පවසනු ලබයි.

ශ්‍රී ලංකාවේ කාලගුණයට බෙහෙවින් බලපාන ගෝලීය තත්ත්වයන් වන එල්නිනෝ (El-nino) සංසිද්ධිය සහ ඉන්දීය සාගරයේ ද්වි-ධ්‍රැවක (Indian ocean Di-pole) තත්ත්වය මේ වනවිට උදාසීන මට්ටම්වල පැවතීමත් ඉදිරියේදී එම තත්ත්වයම බල පැවැත්වීමට ඇති හැකියාව බොහෝ සෙයින් වැඩිවීම නිසාත් ඉහත පුරෝකථනය යථාර්තයක් වීමට ඇති ඉඩකඩ බෙහෙවින් වැඩිය.

එබැවින් ඒ ඒ ප්‍රදේශ වලට යල කන්නයේදී අපේක්ෂිත වර්ෂාපතනයක් ලැබේය යන ස්ථාවරය මත පිහිටා සිට කන්නයේ ඉදිරි වගා කටයුතු සැලසුම් කිරීම සඳහා ගොවීන් යොමු කළහැක


වැඩි විස්තර සඳහා:

**ආචාර්ය බී. වී. ආර්. පුණ්‍යවර්ධන**

ස්වභාවික සම්පත් කළමණාකරන මධ්‍යස්ථානය

පේරාදෙණිය



| | | |
|---|---|---|
| අධීක්ෂණය | පී.කේ.කේ.ආර්. පෙරේරා | - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) |
| සැකසුම | චාමරි නිලූෂි සිල්වා | - කෘෂිකර්ම උපදේශක (සන්නිවේදන) |